රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 27/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
1992 ඔක්තෝබර් මස 07 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් වෙත.

## අසනීප නිවාඩු –XII පරිච්ඡේදය – ආයතන සංග්‍රහය.

1986.02.17 දින අංක. 321 හා 1988.03.30 දින අංක. 10/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

02. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 06 වෙනි වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් පරිදි ආදේශ කරන්න.

“ 6 – අසනීප නිවාඩු

6:1 - නිලධාරියෙකු රෝගී වීම නිසා නිවාඩු ඉල්ලුම් කරන විට හෝ අසනීපයක් නිසා දින දෙකකට වැඩි කාලයක් තුළ කාර්යාලයට පැමිණීමට නොහැකි වන විට හෝ එම නිලධාරියා, ළඟම සිටින වෛද්‍ය නිලධාරියා ලවා තමා පරීක්‍ෂා කරවා ගත යුතුය. එසේ පරීක්‍ෂා කරන ලද වෛද්‍ය නිලධාරියා රජයේ වෛද්‍ය නිලධාරියෙක් නම් වෛද්‍ය 170 හෝ ආයුර්වේද 44 දරණ ආකෘති පත්‍රයෙහි ලියන ලද සහතිකයක් හෝ නිලධාරියා පරික්ෂා කරන ලද්දේ ආයුර්වේද පනත යටතේ හෝ වෛද්‍ය ආඥා පනත යටතේ හෝ ලියාපදිංචි වී ඇති පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයෙකු වූයේ නම් එවැනි පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයෙකු තමන් විසින්ම සකස් කර ගන්නා ලද විශේෂ ආකෘති පත්‍රයක ලියන ලද සහතිකයක් නිලධාරියා රාජකාරියෙහි යෙදී සිටින දෙපාර්තමේන්තු හෝ උප කාර්යාලයේ ප්‍රධානියා වෙත යැවිය යුතුය.

6:1:2: වෛද්‍ය සහතික පිළිබඳ උපදෙස් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරේ.

6:2: ලෙඩ රෝග වෙනුවෙන් එක් වරකට දින 06 ක් දක්වා වූ කෙටි කාල පරිච්ඡේදයක් සඳහා ගනු ලබන නිවාඩු නිලධාරියාගේ කැමැත්ත පරිදි ඔහුගේ අනියම් නිවාඩුවලින් අඩු කළ හැකිය.

නිලධාරියෙකු සේවයට නොපැමිණීම යම් කෙටි කාල පරිච්ඡේදයක් එකී නිලධාරියාගේ විවේක නිවාඩුවලින් අඩුකළ යුතු යයි කිසියම් හේතුවක් නිසා දෙපාර්තමේන්තු ප්‍රධානියාට තීරණය කළ හැකිය.

**6:3** - සාමාන්‍ය තත්ත්වයන් යටතේ එවැනි වෛද්‍ය සහතිකයක් අවශ්‍ය නොවන අවස්ථාවක, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට හෝ නිවාඩු අනුමත කරන නිලධාරියෙකුට හෝ, නිලධාරියෙකුගේ නිවාඩු සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ වෛද්‍ය සහතිකයක් අවශ්‍ය යයි හැඟී ගියහොත්, එවැනි සහතිකයක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමට බලය තිබේ. "

අ.කලේ/ (එම්.එන්.ජුනයිඩ්),
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.